**ශීර්ෂය 304 - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වේ. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 304 - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරන විගණන වාර්තාව 2018 අගෝස්තු 28 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයෙහි සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.13 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත

සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128 (1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මුල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම | 1. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම. | 2.2.1 |
| | | 2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.2 |
| | | 3. අනාර්ථික ගනුදෙනු | 2.4 |
| | | 4. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.6 |
| | | 5. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.9 |
| | | 6. මානව සම්පත් කළමනාකරණය | 2.11 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | අනුකූල නොවීම් | 2.10 |
| 128(1)(ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.7 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 (ආ) |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල නොකිරීම | 2.1.1 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳි සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව . | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.8 |

## 2 ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 කාර්යසාධනය

-----------------

#### 2.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

--------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජූලි 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

-------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු.මිලියන 27.8 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 26.48 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

**2.2.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම**

**--------------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) මාර්ගෝපදේශයට පටහැනිව 2017 වර්ෂය ආරම්භයේදී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු කාලගුණ විද්‍යා උපකරණ, පාරිභෝජක ද්‍රව්‍ය, ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා ප්‍රසම්පාදනය සඳහා වූ තාක්ෂණ ඇගයීම් කමිටුවේ සභාපති වශයෙන් සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ හා සුළු ප්‍රසම්පාදන කමිටුවේ විකල්ප සමාජිකයෙකු වශයෙන් පත් කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1 (අ) මාර්ගෝපදේශයට අනුව කමිටුවල ලේකම්වරයා විසින් සෑම රැස්වීමක්ම පවත්වනු ලබන දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳව සමාජිකයන් වෙත කලින් දැනුම් දිය යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය අනුව වාර්තා ගත කිරීමේ කාර්යය සඳහා සමාජිකයන්ගේ පැමිණීමේ ලේඛනයක් කමිටුවේ ලේකම්වරයා විසින් පවත්වාගත යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12 මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික කමිටු සමාජිකයන් විසින් ඔවුන් කළ යුතු ප්‍රකාශ සිදු කර නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයට සකස් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර නොතිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය අනුව සවිස්තර ප්‍රසම්පාදන සැලැස්මක් එම ආකෘතිය පරිදි සකස් කර නොතිබුණි.

(ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) මාර්ගෝපදේශයට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කරනු ලැබිය යුතු වුවත් එසේ කර නොතිබුණි.

(උ) ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රධාන කාර්යාලය අළුත්වැඩියාව 2017 නොවැම්බර් 30 වන විට අවසන් කළ යුතු වුවද 2018 පෙබරවාරි 28 වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

**2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

**--------------------------------------------**

**(අ) ස්වයංක්‍රීය වර්ෂාමාන 100 ක් මිලදී ගැනීම**

**--------------------------------------------**

සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් මිලදීගෙන තිබුණු රු.37,052,905 ක් වටිනා ස්වයංක්‍රීය වර්ෂමාන සම්බන්ධයෙන් සිදුකර තිබූ ප්‍රසම්පාදනයට අදාලව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශයට අනුව ජාතික තරඟකාරී පදනම මත ලංසු කැඳවීම සිදුනොකර එහි 3.3. මාර්ගෝපදේශයට අනුව දේශීය සැපයුම්කරුවන්ගෙන් සීමිත මිල කැඳවීම් සිදුකර තිබුණද එම ක්‍රමවේදය තෝරාගැනීමට පදනම් කරගත් නිර්නායක පිළිබඳ තොරතුරු හෙළිදරව් නොවීය.

(ii). මිල කැඳවීමට ප්‍රථම පිරිවිතර සම්බන්ධයෙන් සාකච්ඡා කර ප්‍රසම්පාදන ලියවිලි සකස් කළ යුතු වුවද ප්‍රසම්පාදන ලියවිලි ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව පිරිවිතර වෙනස්කර තිබුණි.

(iii). ගංගාධාරවල සවි කිරීම සඳහා ස්වයංක්‍රීය වර්ෂාමාන මිලදී ගැනීමට ප්‍රථම ස්ථානීය පරීක්ෂණ සිදුකර සවිකරන ස්ථාන තීරණය කර නොතිබුණු අතර මිලදී ගැනීමෙන් පසු සවි කිරීම සඳහා ස්ථාන තීරණය කර ඇති බව නිරීක්ෂණය විය.

(iv). ප්‍රසම්පාදන දැන්වීම හා උපදෙස් පත්‍රිකාවේ 8.3 ඡේදය ප්‍රකාරව මුද්‍රා තබන ලද මිල ගණන් භාරගත යුතු වුවද ඉදිරිපත් කළ මිල ගණන්වල මුද්‍රා තැබීමක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර ලංසු විවෘත කිරීමේ කමිටුවේද අවධානය ඒ පිළිබඳ යොමු වී නොතිබුණි.

(v). තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව 2017 දෙසැම්බර් 21 දින තරඟකාරී ආයතනවලට ලංසුවල පැවති අඩුපාඩු සම්පූර්ණ කරන ලෙස දන්වා යවා ඇති බව වාර්තා වී තිබුණ ද, එම අඩුපාඩු පිළිබඳව නොසලකා ස්වයංක්‍රීය වර්ෂාමාන 100 මිලදී ගැනීමට 2017 දෙසැම්බර් 22 දින රැස්වී ඇති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි.

(vi). ලංසු කැඳවීමේ ලේඛනවල හා ලංසුකරුවන් වෙනුවෙන් ලබා දී තිබූ උපදෙස් පත්‍රිකාවේ 2.1 ඡේදයේ සඳහන් වන පරිදි ස්වයංක්‍රීය වර්ෂාමාන සැපයීම පිළිබඳ පලපුරුද්ද සම්බන්ධයෙන් ලිඛිත සහතික නොමැතිව සැපයුම්කරුවෙකු තෝරාගන තිබුණි. තවද ලංසු කැඳවීමේ ලේඛනවල 7.3 ඡේදය පරිදි කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමක් ද 2018 ජුනි 14 දින වන විටත් අත්සන් කර නොතිබුණි.

(vii). ලංසු කැඳවීමේ ලේඛනවල ඇතුළත් පොදු කොන්දේසි 11.1 ඡේදය පරිදි 2017 දෙසැම්බර් 31 දින වන විට භාණ්ඩ සැපයීම් සම්පූර්ණ කළ යුතු වුවද එදින වන විට කිසිදු වර්ෂාමානයන් සපයා නොතිබුණි.

(viii). ලංසු ලියවිලි වල පොදු කොන්දේසි අංක 2.2 ඡේදය අනුව වර්ෂාමානයන් දෙපාර්තමේන්තුව වෙත ලැබුණු පසු වටිනාකමින් සියයට 60 ක් ගෙවිය හැකි වුවද, දෙපාර්තමේන්තුවට වර්ෂාමාන උපකරණ ලැබී නොතිබිය දී ඒ සඳහා මුළු මුදල වූ රු.37,052,905 ක් ගෙවීම් කරන ලෙස 2017 දෙසැම්බර් 28 දින අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කර ඇති බව ලිපි ලේඛන අනුව නිරීක්ෂණය විය.

**(ආ) කාලගුණ විද්‍යා උපකරණ මිලදී ගැනීම**

---

වටිනාකම රු.5,730,963 ක් වූ කාලගුණ විද්‍යා උපකරණ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ලියවිලිවල සඳහන් උපදෙස් පරිදි සුදුසුකම්, පූර්ව කාර්යසාධනය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු සැපයුම්කරුවන් විසින් ලබා දී නොතිබුණු අතර ඒ සම්බන්ධව ප්‍රසම්පාදන මණ්ඩලය සලකා බලා නොතිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

---

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාහන උපයෝජනය**

---

දෙපාර්තමේන්තුව සතු සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාහන 08 ක් පැවැති අතර, එම වාහනවලින් කිලෝ මීටර් 116,425 ක් ධාවනය කර තිබුණු අතර, ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.1,436,601 ක් හා අළුත්වැඩියා සඳහා රු.802,910 ඇතුළත්ව මෝටර් වාහන

නඩත්තු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.3,208,475 ක මුදලක් වැය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් වාහන ධාවනය කිරීම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝ මීටරයක් සඳහා රු.28 ක් වැය කර තිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

දෙපාර්තමේන්තුව විසින් වෙනත් විවිධ ආයතනවලට අයත් පරිශ්‍රයන්වල පවත්වාගෙන යනු ලබන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 12 ක ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 අනාර්ථික ගනුදෙනු

**ඩොප්ලර් රේඩාර් පද්ධතිය**

2006 අයවැය යෝජනාවක් අනුව ඩොප්ලර් රේඩාර් පද්ධතියක් පිහිටුවීම සඳහා උපරිම වශයෙන් රු.මිලියන 400 ක් අයෝජනය කිරීමට රජය තීරණය කර තිබුණි. 2007 හා 2008 වර්ෂ අවසන් වන විට මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින්, ලෝක කාලගුණ විද්‍යා සංගමයේ භාරකාර අරමුදලේ රු. මිලියන 320 ක් තැන්පත් කර තිබුණි. තවද මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් 2010 මාර්තු 12 දින මීටර් 23 ක් උස කුළුණක් හා මීටර් 50 ක් දිග ප්‍රවේශ මාර්ගයක් රු.60,452,000 ක පිරිවැයකට දෙනියාය ප්‍රදේශයේ ඉදිකිරීම සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාලය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2011 වර්ෂයේ මෙරට ලැබී තිබුණු රේඩාර් පද්ධතිය 2014 වර්ෂයේදී ස්ථාපිත කර තිබුනු නමුත් දිගු කලක් නිශ්කාර්යව ගබඩා කර තැබීම හේතුවෙන් ක්‍රියාවිරහිතව තිබුණි. 2018 අප්‍රේල් 25 දින වන විට ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ භාරකාර අරමුදලේ තව දුරටත් ඉතිරිව පැවති ඇ.ඩොලර් 1,063,946 ක මුදල උපයෝජනය කර ගනිමින් රේඩාර් පද්ධතිය අළුත්වැඩියාකිරීමට සැපයුම්කරු එකගවී තිබුණි. ඒ අනුව යන්ත්‍රයේ කොටස් අළුත්වැඩියා කටයුතු සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ නිෂ්පාදන සමාගම වෙත 2017 අප්‍රේල් 21 දින විට නැව්ගත කර තිබුණු අතර ඒ සඳහා රු.5,644,398 ක අමතර පිරිවැයක් දරා තිබුණි. කෙසේවෙතත් 2018 ජූලි 30 දින තෙක් එය නැවත දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි.

## 2.5 කළමනාකරණ දුර්වලතා

ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 37 ක් දිවයින පුරා පිහිටුවා තිබුණ ද 2017 දෙසැම්බර් 31 දින වන විට මධ්‍යස්ථාන 15 කින් පමණක් කාලගුණ දත්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙමින් පැවති බව නිරීක්ෂණය විය. තවද, දෙපාර්තමේන්තුවට අයත් වර්ෂාපතන මිනුම් මධ්‍යස්ථාන 521 ක් දිවයින පුරා විසිරී පවතින අතර 2017 වර්ෂය තුල අඛන්ඩව මධ්‍යස්ථාන 35 කින් තොරතුරු ලැබී නොතිබුණි.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 180.65 | 180.00 | 0.65 | 0.35 |
| | මූලධන | 69.28 | 67.14 | 2.14 | 3.09 |
| | **එකතුව** | **249.93** | **247.14** | **2.79** | **1.12** |
| 2014 | පුනරාවර්තන | 206.73 | 206.53 | 0.20 | 0.09 |
| | මූලධන | 83.79 | 72.91 | 10.88 | 12.98 |
| | **එකතුව** | **290.52** | **279.44** | **11.08** | **3.81** |
| 2015 | පුනරාවර්තන | 255.18 | 248.53 | 6.65 | 2.62 |
| | මූලධන | 348.00 | 111.53 | 236.47 | 67.95 |
| | **එකතුව** | **603.18** | **360.06** | **243.12** | **40.30** |
| 2016 | පුනරාවර්තන | 268.30 | 256.09 | 12.21 | 4.55 |
| | මූලධන | 73.20 | 50.78 | 22.42 | 30.62 |
| | **එකතුව** | **341.50** | **306.87** | **34.63** | **10.14** |
| 2017 | පුනරාවර්තන | 260.88 | 254.98 | 5.90 | 2.26 |
| | මූලධන | 62.50 | 49.52 | 12.98 | 20.76 |
| | **එකතුව** | **323.38** | **304.50** | **18.88** | **5.84** |

**විසර්ජන ගිණුම**

මනා අධ්‍යානයකින් තොරව ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් මූලධන වැය විෂයයන් 03 ක රු.12,047,525 ක ප්‍රතිපාදන සියයට 26 ක සිට සියයට 92 ක් දක්වා පරාසයක් තුළ ඉතිරිවීම් සිදු වී තිබුණි.

## 2.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 30401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12.00 | 9.22 | 8.00 | 9.05 | 55.00 | 29.76 |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

**-----------------------------------------**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂය රු.143,072 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 05 කට වැඩි කාලයක් පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

**2.8 පොදු තැන්පත් ගිණුම**

**-----------------------**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 8.99 ක් විය. එම තැන්පතු වලින් වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 225,872 ක් වූ තැන්පතු 43 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි

**2.9 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** | **නිරීක්ෂණ** |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502 (2) හි එහි 11 වැනි පරිශිෂ්ඨය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලිනව පවත්වා නොතිබුණි. |
| (ආ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි |
| (ඇ) | ඇප තැන්පත් ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වා නොතිබුණි |
| (ඈ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) | පවත්වා නොතිබුණි |

**2.10 අනුකූල නොවීම්**

**----------------**

**2.10.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**----------------------------------------------**

ලෝක කාලගුණ විද්‍යා සංගමයේ මාර්ගෝපදේශ අනුව, කාළගුණ විද්‍යා මධ්‍යස්ථානයක උපකරණ කොටුව මීටර් 25×25 ප්‍රමාණයකට ස්ථාපිත කල යුතුවේ. එසේ වුවද ගාල්ල නගරයේ වූ මධ්‍යස්ථානයේ මීටර් 12 × 9 ප්‍රමාණයකට හා හම්බන්තොට මධ්‍යස්ථානය මීටර් 16×12 ක ප්‍රමාණයකට උපකරණ කොටු ස්ථාපිත කර තිබුණි.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

## 2.11.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වෙනුවෙන් රු. මිලියන 202,999,636 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 54 | 43 | 11 |
| (ii) | තෘතියික මට්ටම | 29 | 09 | 20 |
| (iii) | ද්විතියික මට්ටම | 238 | 201 | 37 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 139 | 129 | 10 |
| | **එකතුව** | **460** | **382** | **78** |